# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

World Health Organization
Sri Lanka

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 40. බාබර් සාප්පු සහ රූපලාවණ්‍යාගාර

මෙම ස්ථානයන්හි කොණ්ඩා කැපීම, කොණ්ඩා මෝස්තර, හිසකෙස් සායම් කිරීම මෙන්ම මුහුණු, නිය, පාද සම්බාහනය වැනි වෙනත් සේවාවන් ඇතුළු සියලු රූපලාවණ්‍ය කටයුතු ද සපයයි. කෝවිඩ් ආශ්‍රිත පූර්වාරක්ෂාව ක්‍රමෝපායන් යටතේ සීමිත කාර්යයන් පමණක් කළ හැකිය.

නිශ්චිත පණිවිඩ / උපදෙස්

සංවිධායක / හිමිකරු / සේවා යෝජකයා

- වැඩ කටයුතු ආරම්භ කිරීමට පෙර නියම කර ඇති කොන්දේසි වලට යටත්ව සේවාවන් ඉටු කරන බවට සහතිකය ලබා ගත යුතුය. (COVID-19 පැතිරීම සඳහා සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශයන්ට අනුව: බාබර් සහ රූපලාවණ්‍යාගාර).
- හිසකෙස් කැපීම, හිසකෙස් සායම් කිරීම, අත් හා පාද වල නිය සම්බාහනය, හිසකෙස් ලිහිල් කිරීම සහ කෙළින් කිරීම, අත් හා පාද වල රෝම ඉවත් කිරීම යන සේවා පමණක් සැපයිය හැකි අතර, මෙම ලැයිස්තුව පාරිභෝගිකයින්ට පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කල යුතුය. රැවුල / උඩු රැවුල කැපීම නිර්දේශ නොකරයි.
- සේවකයින් සහ පාරිභෝගිකයා යන දෙදෙනාම මුහුණු ආවරණයක් පැළඳිය යුතුය. මීට අමතරව බාබර් / ඇඳුම් අන්දන්නන් මුළු මුහුණම වැසෙන පරිදි ඇති විනිවිද පෙනෙන මුහුණු ආවරණයක් හෝ ආරක්ෂිත ඇස් කණ්ණාඩි පැළඳිය යුතුය.
- ගනුදෙනුකරුවන්ට සහ සේවකයින්ට පිවිසුම් දොරටුව අසල අත් සේදීමේ පහසුකම් තිබිය යුතුය.
- කලින් වේලාවන් වෙන් කරගත් ගනුදෙනුකරුවන්ට පමණක් සේවාව සපයන්න. වේලාව වෙන් කිරීමට පෙර උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව උගුරේ වේදනාව, හුස්මගැනීමේ අපහසුතා වැනි රෝග ලක්ෂණ ඇත්දැයි විමසන්න.
- කෝවිඩ්-19 පාලනය කිරීම සඳහා සේවාවන් ආරම්භ කිරීමට පෙර සියලුම සේවකයින්ට ඒ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විය යුතුය.
- ගනුදෙනුකරුවන් අතර අවම වශයෙන් මීටර 1 ක දුරස්ථභාවයක් පවත්වා ගෙන යන බවට සහතික වන්න. ඒ අනුව බාබර් සාප්පුවට / රූපලාවණ්‍යාගාරයට ඇතුළු වන ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව සීමා කරන්න.
- සෑම ලිනන් රෙදි (තුවා සහ තොප්පි) එක් එක් භාවිතයෙන් පසු සේදිය යුතු අතර සේදීමකින් තොරව වෙනත් පාරිභෝගිකයෙකු මත කිසි විටෙකත් භාවිතා නොකළ යුතුය.
- සියළුම උපකරණ සහ මෙවලම් (පනා සහ බුරුසු ඇතුලුව), මේසය සහ පුටුව එක් පාරිභෝගිකයෙකු සඳහා භාවිතා කිරීමෙන් පසුව, වෙනත් පාරිභෝගිකයෙකු භාවිතා කිරීමට පෙර විෂබීජහරණය කළ යුතුය.
- එක් එක් සේවකයින් (බාබර් / ඇඳුම් අන්දවන්නන්) අතර උපකරණ බෙදා ගැනීමෙන් වළකින්න.
- දොර හැඬල, කවුන්ටර වැනි නිතර ස්පර්ශ වන පෘෂ්ඨයන් නිතිපතා විෂබීජහරණය කරන්න.
- සඟරා, පුවත්පත්, සේවා මෙනු සහ අලංකරණය සඳහා ඇති අනවශ්‍ය අයිතම ඉවත් කරන්න.
- වාතය සංසරණය වීම වැඩි කිරීමට හැකි සෑම වෙලාවකම දොරවල් සහ ජනෙල් විවර කරතබන්න.
- වායු සමීකරණයක් ඇත්නම්, හැකි සෑම වෙලාවකම එය සාමාන්‍ය වේගයකින් ක්‍රියාත්මක කර තබන්න.
- පහත සඳහන් ක්‍රියා පටිපාටි කොවිඩ්-19 සම්ප්‍රේෂණය වීමේ ඉතා ඉහළ අවදානමක් ඇතැයි සැලකේ
    - මුහුණේ රෝම ඉවත් කිරීම .
    - මුහුණු පැහැපත් කිරීම.
    - රැවුල කැපීම.
    - ඇහිබැමි සැකසීම.
    - මේකප් කිරීම්.

- මෙම ක්‍රියා පටිපාටි පැවැත්විය යුත්තේ එය අත්‍යවශ්‍ය යැයි සැලකෙන මනාලියන්ගේ ඇඳුම් ඇඳීමේදී වැනි අවස්ථාවන්හිදී පමණක් වන අතර අවම ස්පර්ශයකට සීමා වේ. මෙම ක්‍රියා පටිපාටීන් සිදුකරන ආයතනවල, කොවිඩ්-19 සම්ප්‍රේෂණය වීමේ අවදානම අවම කිරීම සඳහා සියලුම පූර්වාරක්ෂාවන් පිළිපදින බව සහතික කිරීමේ ආකෘති පත්‍රය ප්‍රදර්ශනය කළ යුතුය. වේලාවන් වෙන් කරවගන්නා අවස්ථාවේ, මෙම සේවාවන් ලබා ගන්නා සියලුම සේවාදායකයින්ට උපදෙස් පත්‍රිකාවක් ලබා දිය යුතුය.

- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම හිමිකරුගේ / භාරකරුගේ වගකීම වේ.

**සේවාලාභීන් සඳහා**

- සුවයක් නොමැති නම් රූපලාවණ්‍යාගාරයට නොයා යුතුය (උණ, කැස්ස සහ සෙම්ප්‍රතශ්‍යාව).
- පළමුව සේවාව සඳහා වේලාවක් වෙන් කරගෙන හමුවීමක් ලබා ගත යුතුය.
- සැම විටම මුහුණු ආවරණයක් පැළඳිය යුතුය.
- ප්‍රදර්ශනය කර ඇති උපදෙස් අනුගමනය කළ යුතුය.
- සේවා ස්ථානයට ඇතුල් වීමට පෙර දෑත් සේදිය යුතුය.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- කොවිඩ් -19 සාමය තුලදී අවසර ලබාදී ඇති සේවාවන් වල ලැයිස්තුවක් දුරකථන අංක සමඟ ප්‍රදර්ශනය කල යුතුය.



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.